# දැන්වීමයි !

## විදේශ රටවල රාජතාන්ත්‍රික සේවයේ හා රැකියාවල නිරතවන/ නිරතවූ දෙමාපියන්ගේ දරුවන් ශ්‍රී ලංකාව තුළ රජයේ විශ්ව විද්‍යාලවල පාඨමාලා හැදෑරීම සඳහා ඇතුලත් කිරීම සම්බන්ධවයි

ශ්‍රී ලංකාව තුළ රජයේ විශ්ව විද්‍යාලවල උපාධි පාඨමාලා හැදෑරීම සඳහා 5% ප්‍රතිශතයක් විදේශීය සුදුසුකම් ලබන දරුවන් සඳහා වෙන් කරන අතර ඊට විදේශ රටවල රාජ්‍ය තාන්ත්‍රික සේවයේ හා රැකියාවල නිරතවන/ නිරතවූ දෙමාපියන්ගේ දරුවන් ද අයත්වනු ඇත. එම බඳවාගැනීමේදී පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණකර තිබිය යුතු ය.

- ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වන ලද, ශ්‍රී ලංකාවේ අ.පො.ස. උසස්පෙළ විභාගයට සමාන වූ විදේශ විභාගයකින් ප්‍රතිඵල ලබා ඇති ශ්‍රී ලාංකික දරුවන් සහ විදේශීය දරුවන්ට මෙම ප්‍රවේශය යටතේ රාජ්‍ය විශ්ව විද්‍යාල සඳහා අයදුම් කළ හැක.

- ශ්‍රී ලාංකික දරුවන් අදාල විභාගයට මුහුණ දීමට පෙර වූ ආසන්න තම අධ්‍යයන වර්ෂ 03 අදාල විදේශ රටෙහි අධ්‍යාපනය හදාරා තිබිය යුතු අතර ඔවුන්ගේ දෙමව්පියන්ද තම දරුවන් සමග එම රටෙහිම අදාල අධ්‍යයන වර්ෂ 03 මුළුල්ලෙහි සේවය කර තිබීම අනිවාර්යවේ. මේ බව සනාථ කිරීම සඳහා සිසුන් විසින් සිය අධ්‍යාපන සහතික, පාසල් හැර යාමේ සහතික සහ දෙමාපියන්ගේ සේවා සහතික සිය අයදුම්පත සමගින් ඉදිරිපත් කළ යුතු වේ.

මේ සම්බන්ධව ඔබ උනන්දුවක් දක්වන්නේ නම් වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයෙන් විමසීම් කළ හැකි වේ.

ලිපිනය : අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ - 07.
දුරකථන අංක : 0112697721, 0112691378, 0112694486, 011-2697133
Web Site: www.mohe.gov.lk

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**නො. 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල**
දුරකථන අංක : ✆ 1989 - ක්ෂණික ඇමතුම්
✆ 011 2880500, 011 2879900, 011 2879901, 011 2879902